# පුනරුදයේ
## මඟ සලකුණු
## 2019 - 2021

කටුකොහොලින් පිරි මාවතක
සාර්ථකත්වය කරා
සපිරිවරින් ඇවිද ගිය
ගමනක
මතකාවර්ජනය ......



බන්ධනාගාර
දෙපාර්තමේන්තුව



ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි
අධිකරණ අමාත්‍ය

# ගරු අධිකරණ අමාත්‍යතුමන්ගේ පණිවිඩය

බන්ධනාගාර දෙපාර්තමේන්තුව නව මාවතකට යොමු කිරීම වෙනුවෙන් පසුගිය වසර එකහමාරකට ආසන්න කාලය තුළ ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘතීන් අලලා සැකසුණු "පුනරුදයක මඟ සලකුණු" සඳහා පණිවිඩයක් එක් කිරීමට ලැබීම සම්බන්ධයෙන් මා සතුටට පත්වෙමි.

රටක අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමයේ අවසන් අදියර නියෝජනය කරන බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත වර්තමාන රජයේ "සෞභාග්‍යයේ දැක්ම" රට ගොඩගැනීමේ වැඩ පිළිවෙලට අනුව, පැවරී ඇති කාර්යභාරය සුළුපටු නොවන බව අප සියළු දෙනාටම පැහැදිලි කරුණකි. රට තුල පවතින අධිකරණ පද්ධතිය තුළින් බන්ධනාගාර ගත කරන සැකකරුවන් අධිකරණ ක්‍රියාදාමය අවසන් වන තෙක් අත්අඩංගුවේ තබා ගනිමින් හා රැකබලා ගනිමින් අවශ්‍ය කටයුතු කරනවා සේම සිරකරුවන් පුනරුත්ථාපනය කොට යහපත් පුරවැසියන් ලෙස නැවත සමාජගත කිරීමේ භාරධූර කාර්යය ද පැවරී පවතින්නේ බන්ධනාගාර දෙපාර්තමේන්තුවටයි. එමෙන්ම, රටේ ජාතික ආරක්ෂාව හා සමාජ සුරක්ෂිත බව තහවුරු කිරීම පිණිස සැලකිය යුතු කාර්යභාරයක් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ඉටුකළ යුතුව පවතී.

බන්ධනාගාර ප්‍රතිසංස්කරණයන් සිදුවිය යුතු අංශ හඳුනාගෙන, එම ප්‍රතිසංස්කරණයන් කෙසේ සිදුවිය යුතු ද පිළිබඳව පස් අවුරුදු සැලැස්මක් සකස් කර එම සැලැස්මේ අරමුණු සාක්ෂාත් කරගනු පිණිස පසුගිය වසර එක හමාරක පමණ කාලය තුළ බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත.

නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී විශේෂයෙන් නව තාක්ෂණය භාවිතා කිරීමට කටයුතු කිරීම හරහා රැඳවියන්ගේ සුභසාධනය වැඩි කිරීමට විශේෂ අවධානයක් යොමුකර ඇති අතර, බන්ධනාගාර තුළ සිට විවිධ නීතිවිරෝධී කටයුතු වල යෙදීම අවම තත්වයකට ගෙන ඒමට හැකියාව ලැබීම පසුගිය වසර එකහමාරක පමණ කාලය තුළ බන්ධනාගාර දෙපාර්තමේන්තුව ලද විශාල ජයග්‍රහණයකි.

එමෙන්ම, අධිකරණ අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව හා අනෙක් වගකිවයුතු ආයතන වලද දායකත්වය මත 2020 වර්ෂයේ ඔක්තෝම්බර් මස පැවති 32000 ක පමණ වූ රැඳවි ප්‍රමාණය 20000 පමණ මට්ටමට අඩුකර ගැනීමට හැකිවීම තුළින් බන්ධනාගාර දෙපාර්තමේන්තුවට පැවති විශාල අභියෝගයකට විසඳුමක් ලැබුණි. තවද, බන්ධනාගාර වල පවතින අධික තදබදයට විසඳුමක් වශයෙන් හා නෙල්සන් මැන්ඩෙලා රීතීන් වැනි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව රැඳවියන්ට පහසුකම් සැපයීමේ අරමුණෙන් කොළඹ බන්ධනාගාර පරිශ්‍රය හොරණ ප්‍රදේශයේ ඇති අක්කර 200 ක භූමි භාගයක ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. එමගින් පුනරුත්ථාපන ක්‍රමවේදය විධිමත් කිරීමට මෙන්ම බන්ධනාගාර නිලධාරීන්ට ප්‍රමාණවත් පහසුකම් සහිතව තම රාජකාරිය සිදු කිරීමට අවශ්‍ය සුදුසු පරිසරයක් නිර්මාණය වනු ඇත.

එමෙන්ම, අධිකරණ අමාත්‍යංශයේ මුලිකත්වයෙන් 1844 අංක 18 දරණ බන්ධනාගාර පනතට කාලීන සංශෝධන සිදු කරමින්, යාවත්කාලීන කරමින්, ජාත්‍යන්තර තලයේ හර පද්ධතීන් මූලිකවම අපේ බන්ධනාගාර පද්ධතියට හඳුන්වා දෙමින් සිටින්නෙමු. මේ වන විටත් බන්ධනාගාර දෙපාර්තමේන්තුව තම සුවිශේෂී අරමුණු ළඟා කරගැනීම පිණිස නව ජවයක් සහිතව කැපවෙන බව පැහැදිළි කරුණක් වන අතර, එම කැපවීමේ සාර්ථක ප්‍රතිඵල ලඟාකරග නිමින් සිටින බවත්, දැනට වසර කිහිපයකට පෙර පැවති බන්ධනාගාර පද්ධතිය හා වර්තමානය වන විට පවතින බන්ධනාගාර පද්ධතිය දෙස අවධානය යොමු කිරීමේ දී මැනවින් නිරීක්ෂණය වන තත්වයකි. ඒ අනුව, විෂය භාර අමාත්‍යවරයා ලෙස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය සම්බන්ධයෙන් සතුටට පත්වෙන අතර, ඒ සඳහා කැපවෙන සියළු නිලධාරීන්ට සුභාෂිංසනය කරමි. එමෙන්ම, දෙපාර්තමේන්තුවේ අරමුණු මුදුන්පත් කරගැනීමට දරණ සෑම උත්සාහයක්ම සාර්ථක වේවායි පතමි. අවසාන වශයෙන් අපට බොහෝ දේ වෙනස් කිරීමට සිතීමට මඟ පෙන්වූ දකුණු අප්‍රිකාවේ ජනාධිපති නෙල්සන් මැන්ඩෙලා මහතා පැවසූවක් උපුටා දක්වමි.

" for to be free is not merely to cast off one's chains, but to live in a way that respects and enhances the freedom of others "

එම වදනට අනුව, නිදහස් වීම යනු, කෙනෙකුගේ දම්වැලි ඉවත් කිරීම පමණක් නොව, අන් අයගේ නිදහස ගරු කරන සහ වැඩිදියුණු කරන ආකාරයෙන් ජීවත් වීමට වටපිටාව සැකසීම බවයි.

අප සියළු දෙනා එක්ව බන්ධනාගාර දෙපාර්තමේන්තුව මෙහෙයවිය යුත්තේ සමස්ත මානව වර්ගයාගේ උපරිම යහපත සැලසීම වෙනුවෙනි.

## අමාත්‍යංශ ලේකම්ගේ පණිවිඩය



**මේජර් ජනරාල් ( විශ්‍රාමික ) වී.ආර්. සිල්වා**

ආර්එස්පී,වීඑස්වී,යූඑස්පී,එන්ඩියූ,අයිපී

ලේකම්

බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යංශය

පුනරුත්ථාපන ක්‍රියාවලිය වඩාත්විධිමත් ආකාරයෙන් සිදු කිරීමටත්, ඒ තුලින් රැඳවියන්ගේ දඬුවම් කාලය අවසන් වී නැවත සමාජයට පිවිසෙන විට වඩාත් යහපත් ගුණධර්ම වලින් පිරිපුන් සමාජයට වැඩදායී මිනිසෙකු ලෙස හැඩගැස්වීම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම අභිලාශයයි. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

වර්තමානයේ බන්ධනාගාර පරිපාලනය මුහුණ දී ඇති ප්‍රධානතම අභියෝගය වන්නේ බන්ධනාගාර තුල පවතින අධික තදබදයයි. මෙම අභියෝගයට සාර්ථකව මුහුණ දීමට වර්තමානයේ දෙපාර්තමේන්තුව විසින් පියවර කිහිපයක්ම ක්‍රියාත්මක කරමින් පවතී.

රට හදන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව, නවීන පහසුකම් වලින් සමන්විත බන්ධනාගාර කිහිපයක් ඉදි කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරමින් සිටියි. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඉදි කරන ලද අඟුණකොලපැලැස්ස බන්ධනාගාරය මේවන විටත් ක්‍රියාත්මක වෙමින් පවතී. රැඳවියන් හට අවශ්‍ය වන මූලික පහසුකම් සලසා දීමට අමතරව දිගු කාලීනව පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා දීම මෙහි අරමුණ වේ.

දරුණු ගණයේ අපරාධකරුවන් විසින් බන්ධනාගාරය තුල සිදුකරනු ලබන විවිධ අපරාධ හා දූෂණ ක්‍රියා හේතුවෙන් සමාජය තුල ගැටළුකාරී තත්වයක් පසුගිය වසර කිහිපය පුරාම ඇති විය. මෙවැනි දරුණු ගණයේ අපරාධකරුවන් වෙනම රඳවා තබා ගැනීම සඳහා බූස්ස බන්ධනාගාර අධි ආරක්ෂිත බන්ධනාගාරයක් වශයෙන් සංවර්ධනය කිරීමට හැකිවීම බන්ධනාගාර දෙපාර්තමේන්තුව ලද විශිෂ්ඨ ජයග්‍රහණයක් බව පෙන්වා දීමට කැමැත්තෙමි.

මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් සාම්ප්‍රදායිකව බන්ධනාගාර තුල රඳවා පුනරුත්ථාපනය කිරීම අවම ප්‍රතිඵල සහිත ක්‍රමවේදයක් බව හඳුනාගෙන ඔවුන්ව පුනරුත්ථාපනය හා ප්‍රතිකාර කිරීම සඳහා වීරවිල බන්ධනාගාරය තුල ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ඉදි කිරීමට කටයුතු සකස් කරමින් පවතී. මෙය මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනයට දෙපාර්තමේන්තුව විසින් ගත් ඉදිරි පියවරක් වේ.

දෙපාර්තමේන්තුවේ බුද්ධි හා ආරක්ෂණ ඒකක සාමාජිකයන් හට සුවිශේෂී පුහුණුවක් ලබා දී ශ්‍රී ලංකා බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය ලෙස බලගැන්වීමට කටයුතු කර ඇති අතර, මෙම ඒකකය සඳහා නවීන තාක්ෂණික ආරක්ෂක උපකරණ ලබා දීම තුලින් බන්ධනාගාරය තුල සිදුවන විවිධ අක්‍රමිකතා හා දූෂණ වැලැක්වීමට කටයුතු කරමින් පවතී.

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ කඩිනමින් සිදු කරමින් රැඳවි පුනරුත්ථාපනයට අදාලව විශාල ප්‍රගතියක් පෙන්නුම් කර ඇති බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ඉදිරි ඉලක්ක සපුරා ගැනීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන අතරම, එම කාර්යයන් ඉටු කිරීමට සහයෝගය දැක්වූ සියළුම නිලධාරීන්ට මාගේ කෘතඥතා පූර්වක ස්තූතිය පුදකර සිටිමි.



**එච්.එම්.ටී.එන් උපුල්දෙණිය**
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

# "ඇරඹුම"

රට තුළ පවතින අධිකරණ පද්ධතිය මගින් බන්ධනාගාරගත කරන රැඳවියන් අත්අඩංගුවේ තබා ගැනීම රැකබලා ගැනීම හා විශෝධනය කිරීම යන ප්‍රධාන අරමුණු ඔස්සේ ක්‍රියාත්මක වෙමින් රටේ ජාතික ආරක්ෂාව හා සමාජ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවට ඇත්තේ සුවිශාල කාර්යභාරයකි.

මෙම කාර්යභාරය බන්ධනාගාර නිලධාරීයාට ඉතා පහසුවෙන් ඉටුකල හැක්කක් නොවන අතර ඉතා කැපවීමෙන් දුෂ්කරතා අවධානම් අභියෝග හා තර්ජන මධ්‍යයේ සිදුකළ යුත්තකි. තවද, බන්ධනාගාර ගත වන්නන්ගෙන් බහුතරයක් දෙනා සමාජයේ ප්‍රගමනයට හා යහපැවැත්මට විරුද්ධව ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් ලෙස රටේ අධිකරණ පද්ධතිය මගින් වැරදිකරුවන් හෝ සැකකරුවන් බවට පත් කරන ලද පුද්ගලයින් වන බැවින් ඔවුන් කළමනාකරණය ඉතා සංයමයෙන් දුර දක්නා නුවණකින් හා උපායශීලීව සිදුකළ යුත්තකි.

ඒ අනුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්යභාරය මැනවින් ඉටු කිරීම පිණිස පසුගිය කාල වකවානුව තුළ බන්ධනාගාර පරිපාලනමය වෙනස්කම් සහිතව ප්‍රතිසංවිධාන කටයුතු ආරම්භ වූ අතර එතැන් පටන් පසුගිය වසරක කාලය තුළ දී බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ උක්ත කාර්යභාරය ඉටුකිරීම සඳහා පියවර ගණනාවක් ගෙන ඇත. එම පියවරයන් පිළිබඳ සාරාංශයක් හා ඒවායේ සාර්ථකත්වය පිළිබඳව මෙමගින් ඉදිරිපත් කරනු ලබයි.

තවද, පසුගිය වසරක කාලය තුල දී බන්ධනාගාර දෙපාර්තමේන්තුව ඉටු කරන ලද කාර්යභාරය හුදෙක් හුදකලාව සිදු කරන ලද්දක් නොවන අතර විවිධ ආයතන දෙපාර්තමේන්තු හා පාර්ශවයන්ගේ නොමද සහයෝගය සමග සිදු කළ කටයුත්තකි. එබැවින්, පසුගිය වසරක කාලය තුල දී මෙම වැඩපිළිවෙලට නන් අයුරින් සහයෝගය ලබා දුන් සියළු පාර්ශවයන්ට ස්තූතිය ප්‍රකාශ කිරීමටත් මෙය අවස්ථාවක් කර ගනිමි.



“

ඔබට කළ නොහැකි දේ
මට කළ හැකියි
මට කළ නොහැකි දේ
ඔබට කළ හැකියි
අප එක්ව වැඩ කලොත්
කිසිවෙකුටත්
කළ නොහැකි දෙයක්
කළ හැකියි

- තෙරේසා මව්තුමිය

# පුනරුදයේ පෙරගමන්කරුවන්



තුසිත ඉන්ද්‍රජිත් උඩුවර
අතිරේක බන්ධනාගාර
කොමසාරිස් ජනරාල් (වැ.ආ)
බන්ධනාගාර කොමසාරිස්
(මෙහෙයුම්/බුද්ධි ආරක්ෂණ)



චන්දන ඒකනායක
බන්ධනාගාර කොමසාරිස්
(පාලන සහ පුනරුත්ථාපන)
බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක

මලින් ලියනගේ
බන්ධනාගාර කොමසාරිස්
(කර්මාන්ත)



සුනිල් කොඩිතුවක්කු
බන්ධනාගාර කොමසාරිස්
(සැපයුම් හා සේවා)





ඉංජි. ඩබ්.එම්.පී.බී. විරසිංහ
අධ්‍යක්ෂ (ඉංජිනේරු)



අනුරාධ රාජසිංහ
කොමසාරිස් (මුදල්)

සුරංජි විජයවර්ධන
අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)



ඩී.එම්.බී. කරුණාරත්න
කොමසාරිස්
(අභ්‍යන්තර විගණන)





වෛද්‍ය හේමන්ත රණසිංහ
නියෝජ්‍ය අධ්‍යක්ෂ
(බන්ධනාගාර වෛද්‍ය සේවා)



ජගත් වීරසිංහ
බන්ධනාගාර අධිකාරී
බන්ධනාගාර මූලස්ථානය


# පස් අවුරුදු සැලැස්මක්



'A RIGHT BASED CORRECTIONAL SYSTEM FOR A SAFER SOCIETY'

'A Right Based Correctional System for a Safer Society' යන තේමාව යටතේ 2021 – 2025 දක්වා වර්ෂ 05 ක කාලය පාදක කර ගනිමින් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හඳුනාගත් ප්‍රධාන ක්ෂේත්‍රයන් 09 ක් ආවරණය වන පරිදි ඉලක්ක ගත කාර්යයන් අත්පත් කර ගැනීම සඳහා මෙම පස් අවුරුදු සැලැස්ම සකස් කර ඇත.

| | |
|---|---|
| 01 | බන්ධනාගාර තදබදය අවම කර ගැනීම |
| 02 | බන්ධනාගාර කළමනාකරණ ප්‍රතිසංස්කරණ |
| 03 | බන්ධනාගාර කාර්ය මණ්ඩල ධාරිතා වර්ධනය |
| 04 | බන්ධනාගාර අණපනත් ප්‍රතිසංස්කරණය |
| 05 | බන්ධනාගාර ආරක්ෂක ක්‍රියාවලිය විධිමත් කිරීම |
| 06 | බන්ධනාගාර සෞඛ්‍ය සේවය වැඩි දියුණු කිරීම |
| 07 | රැඳවි විශෝධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම හා ශ්‍රම බලකායේ ඵලදායී භාවිතය සඳහා වන ක්‍රියාමාර්ග |
| 08 | කාන්තා බන්ධනාගාර හා තරුණ වරදකරුවන්ගේ පුහුණු මධ්‍යස්ථාන ප්‍රතිසංවිධානය කිරීම |
| 09 | e- බන්ධනාගාර සංකල්පය ක්‍රියාත්මක කිරීම |




ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ආයතන පද්ධතිය තුළ රැඳවිය හැකි සමස්ථ රැඳවි ධාරිතාවය රැඳවියන් 13241 ක් පමණි. එසේ වුව ද, වසර ගණනාවක් තිස්සේ මෙම ධාරිතාවය ඉක්මවා රැඳවීමක් සිදුවෙමින් පවතින අතර, ඉතිහාසයේ කිසිම දිනක නොවූ පරිදි 2020 වර්ෂයේ ඔක්තෝම්බර් මාසය තුළ මෙම රැඳවියන් 32000 දක්වා වර්ධනය වී දැඩි පීඩාකාරී තත්වයක් බන්ධනාගාර ආයතන තුල ඇති වූ අතර, එම පීඩාකාරී තත්වය දෙගුණ තෙගුණ කරමින් කොවිඩ් - 19 වසංගතය ද දැඩි බලපෑමක් ඇති කරන ලදී.

මේ පිළිබඳව අතිගරු ජනාධිපතිතුමන්ගේ විශේෂ අවධානය යොමු වූ අතර, ගරු අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතිඥ අලි සබ්රි මැතිතුමාගේ හා බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමාගේ ද උපදෙස් පරිදි ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව, රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන සමග සාකච්ඡා කර සුළු වැරදි සඳහා හා මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී විවිධ හේතු මත රක්ෂිත බන්ධනාගාර ගත කොට සිටි 13000කට ආසන්න රැඳවියන් පිරිසකට ඇප ලබාදී සමාජගත කිරීමට අවස්ථාව සලසා දුනි. එමෙන්ම, මේ සම්බන්ධයෙන් පවතින නීති සමාලෝචනය කිරීමට අවශ්‍ය පියවර ද ගන්නා ලදී.

# ජාතික ආරක්ෂාව / සමාජ ආරක්ෂාව සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායේ කාර්යභාරය




රටේ අධිකරණ පද්ධතිය මගින් වැරදිකරුවන් / සැකකරුවන් ලෙස බන්ධනාගාර ගත කරන පාතාල කල්ලි සාමාජිකයින් මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් රට තුළ ඇති විවිධ බන්ධනාගාර ආයතන වල රඳවා තිබූ අතර ඔවුන් බන්ධනාගාර ආයතන තුළ සිට අපරාධ මෙහෙයවීම ජාවාරම් දිගින් දිගටම සිදුකරන බවට විවිධ චෝදනාවන් එල්ල වූ අතර ඔවුන් බන්ධනාගාර පරිපාලනයට ද දැඩි අභියෝගයක්ව තිබුණි. ඔවුන් විසින් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පහළ නිලධාරීන්ට මෙන්ම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට පවා අභියෝග කරමින් තර්ජනය කරමින් පරිපාලනයට බාධා කරමින් කටයුතු කරන තත්වයක් උද්ගත වී තිබුණි.

ඒ අනුව, ආරක්ෂක අමාත්‍යංශ ලේකම්තුමන්ගේ ප්‍රධානත්වයෙන් හා බන්ධනාගාර කොමසාරිස් ජනරාල්තුමන් ද සාමාජිකත්වය දරණ "සුරක්ෂිත රටක්, විනය ගරුක හා නීති ගරුක සමාජයක් ගොඩ නැගීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය" මගින් මොවුන්ගේ නීති විරෝධී කටයුතු නවතා රටේ ආරක්ෂාව සමාජ සුරක්ෂිත බව හා බන්ධනාගාර ආයතන පරිපාලනය ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලද අතර, බූස්ස අධි ආරක්ෂිත බන්ධනාගාරය පිහිටුවා දැඩි අධීක්ෂණ ක්‍රමවේදයක් යටතේ මෙම රැඳවියන් රඳවා තැබීමට කටයුතු කරන ලදී.

### බූස්ස අධි ආරක්ෂිත බන්ධනාගාරය ස්ථාපනය කිරීමේ අරමුණ

01 සමාජයට දැඩි තර්ජනයක් වූ රටේ ප්‍රධාන පෙළේ පාතාල කල්ලි නායකයන් රැඳවීම.

02 මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් වෙන්කර රැඳවීම.

03 දැඩි ආරක්ෂාවක් අවශ්‍ය හා බාහිර තර්ජන සහිත රැඳවියන්ට අවශ්‍ය ආරක්ෂාව සැපයීම.

04 විශේෂ ගණයේ රැඳවියන් එක් ස්ථානයක රැඳවීමෙන් කළමනාකරණය පහසුවීම හා විශේෂ අවධානයක් යොමුකිරීමේ හැකියාව.

05 ජාතික ආරක්ෂාවට හා සමාජ සුරක්ෂිත බවට බලපෑම් කරන රැඳවියන්ට එවැනි කටයුතු සිදු කළ නොහැකි පරිදි වෙන්කර රැඳවීම.

### බූස්ස අධි ආරක්ෂිත බන්ධනාගාරය ස්ථාපිත කිරීමෙන් ඇති වූ ප්‍රගතිය

01 බන්ධනාගාර දෙපාර්තමේන්තුවට පැවති චෝදනා, විවේචන ඉතා අවම තත්වයට පත්වීම.

02 මෙම ආයතනයේ රඳවා ඇති පාර්ශවයන් කළමනාකරණයේ දී බන්ධනාගාර නිලධාරීන්ට පෙර පැවති පීඩාකාරී තත්වය හා තර්ජන අඩුවීම.

03 ප්‍රමාණවත් ආරක්ෂාවක් යටතේ විශේෂ ගණයේ රැඳවියන් රඳවා තබා ගැනීමට හැකිවීම.

04 බන්ධනාගාර තුළ සිට අපරාධ මෙහෙයවීම, මත්ද්‍රව්‍ය ජාවාරම් සිදුකිරීම, කප්පම් ගැනීම් හා තර්ජනය කිරීම් ආදිය අවම කර ගැනීමට හැකිවීම.

# දුරකථනය බන්ධනාගාරයට අභියෝගයක්

රැඳවියන් බන්ධනාගාර තුළ සිට මත්ද්‍රව්‍ය ජාවාරම් මෙහෙයවීම කප්පම් ගැනීම සහ වෙනත් අපරාධ කටයුතු මෙහෙයවීම සිදු කරන බවට දිගින් දිගටම චෝදනා එල්ල විය. මෙම තත්වය ඇතිවීමට ප්‍රධාන හේතුව වන්නේ ජංගම දුරකථන බන්ධනාගාර රැඳවියන් අතට පත්වීමයි.

එබැවින්,
බන්ධනාගාර තුළ දුරකථන සංඥා අවහිර කිරීමේ පද්ධති සවිකිරීමේ අරමුණ වන්නේ රැඳවියන් විසින් බන්ධනාගාර තුල සිට දුරකථන ඇමතුම් ලබා ගැනීම වැලැක්වීමයි.
ඒ අනුව මේ වන විට,

වැලිකඩ බන්ධනාගාරය
අඟුණකොලපැලැස්ස බන්ධනාගාරය
බූස්ස බන්ධනාගාරය
මීගමුව බන්ධනාගාරය
කළුතර බන්ධනාගාරය

යන ආයතන වල මෙම දුරකථන සංඥා අවහිර කිරීමේ පද්ධති ස්ථාපනය කර ඇති අතර මහර, කළුතර හා දුම්බර යන ආයතන තුළ පද්ධති ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. මේ සඳහා රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යංශය යටතේ පවතින ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සිය පූර්ණ සහයෝගය ලබාදේ.






# බන්ධනාගාරයට දෙවන ඇසක් ස්ථාපිත කිරීම

බන්ධනාගාර ආයතනවල ආරක්ෂිත කැමරා පද්ධති ස්ථාපිත කිරීම බන්ධනාගාර ආයතන තුළ හා පිටත ආරක්ෂාව තර කිරීමත් බන්ධනාගාර වල එදිනදා කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය පහසු කිරීමත් හා ආයතන තුළ හා පිටත සිදුවිය හැකි අක්‍රමිකතා අවම කිරීම යනාදියට ඉතා වැදගත් වේ.

ඒ අනුව, මේවන විට අඟුණකොලපැලැස්ස බන්ධනාගාරය, බූස්ස බන්ධනාගාරය හා කළුතර බන්ධනාගාරය යන ආයතනවල කැමරා පද්ධති ස්ථාපිත කොට අවසන් කර ඇත. එමෙන්ම, වැලිකඩ බන්ධනාගාරය, කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය, නව මැගසින් බන්ධනාගාරය, වැලිකඩ බන්ධනාගාර කාන්තා අංශය හා වැලිකඩ බන්ධනාගාර රෝහල යන ආයතන පවතින කොළඹ බන්ධනාගාර පරිශ්‍රය ආවරණය වන පරිදි ආරක්ෂිත කැමරා පද්ධති ස්ථාපිත කිරීමේ කටයුතු මේවන විට ආරම්භ කර ඇත.

එමෙන්ම, මහර සහ මීගමුව යන බන්ධනාගාර ආයතනවල කැමරා පද්ධති ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික කටයුතු අවසන් කර ඇත.

# කණ්ඩායම් හැඟීමෙන් අරමුණට කැපවෙමු





බන්ධනාගාර තුලට තහනම් ද්‍රව්‍ය ඇතුළු වීම දිගින් දිගටම සිදුවීම බන්ධනාගාර පරිපාලනයේ දී විශාල අභියෝගයක්ව පවතින අතර ඒවා අවම කිරීම හා බන්ධනාගාර වල පිටත ආරක්ෂාව තර කිරීමේ අරමුණින් පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් බන්ධනාගාර ආයතන වල පිටත ආරක්ෂක රාජකාරි සඳහා අනුයුක්ත කිරීම සිදු කරන ලදී.

ඒ අනුව, ඔවුන් විසින් බන්ධනාගාර වල පහත කටයුතු වල නිරත වී සිටි.

- බන්ධනාගාර තුළට ඇතුළුවන සිර / සැකකරුවන් සෝදිසි කිරීම
- බන්ධනාගාර තුළට ඇතුළුවන නිලධාරීන් හා වෙනත් පාර්ශව සෝදිසි කිරීම
- බන්ධනාගාර තුළට ඇතුළු වන සියළුම වාහන භාණ්ඩ ද්‍රව්‍ය සෝදිසි කිරීම
- බන්ධනාගාර වල පිටත මුර පොලවල් මුර අට්ටාල වල ආරක්ෂක කටයුතු වල නිරත වීම
- බන්ධනාගාර වල ස්ථාපිත කොට ඇති CCTV හා දුරකථන සංඥා අවහිර කිරීමේ පද්ධති ( ජෑමර් පද්ධති ) වල අධීක්ෂණ කටයුතු වල නිරත වීම
- බන්ධනාගාර රැඳවියන් ආරක්ෂණය කිරීම

මේ වන විට ඔවුන් අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය, බූස්ස අධි ආරක්ෂිත බන්ධනාගාරය, කොළඹ බන්ධනාගාර පරිශ්‍රය යන ආයතන වල රාජකාරි කටයුතු වල නිරතව සිටි.

# රැඳවියන්ට බාහිර සමාජයට නව ප්‍රවේශයක්



බන්ධනාගාර ගත වන සිර / සැක රැඳවියන්ට මෙන්ම ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට තම ඥාතීන් හමුවීම සඳහා පහසුකම් සැපයීම මානව අයිතියක් මෙන්ම බන්ධනාගාර පරිපාලනය හා සම්බන්ධ දේශීය හා ජාත්‍යන්තර රෙගුලාසි හා ප්‍රමිතීන්ට අනුව අයිතියක්ව පවතී.

ඒ අනුව,

ඥාතීන් හමුවීම සඳහා පවතින යල් පැනගිය ක්‍රමවේදය

ඉතා දුර බැහැර සිට කාලය හා මුදල් වියදම් කරමින් පැමිණීමට සිදුවීම

පවතින ක්‍රමවේදයේ අක්‍රමිකතා වලට පවතින ඉඩකඩ

කොවිඩ් – 19 වැනි වසංගත තත්ව තුල දී වුව ද තම ඥාතීන් හමුවීමට අවස්ථාව සලසා දීම

යනාදී කරුණු සලකා බලා නූතන තාක්ෂණය භාවිතා කරමින් ඉහත ගැටළු වලට විසඳුම් වශයෙන් ***E-Visit*** සංකල්පය හඳුන්වා දෙන ලදී. මේ යටතේ ***Pre Booked Visit*** සංකල්පය ***Video Visitation*** යන ක්‍රමවේදයන් හඳුන්වා දී ඇත.

***Video Visitation*** ක්‍රමවේදය භාවිතා කරමින් අමුත්තන් පෙන්වීමේ කටයුතු බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු ගරු රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්තේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අගුණකොළපැලැස්ස බන්ධනාගාරයේ දී ආරම්භ විය. එය මේවන විට බන්ධනාගාර ආයතන කිහිපයක ක්‍රියාත්මක කරමින් පවතින අතර, ඉදිරියේ දී රට තුළ පවතින සෑම බන්ධනාගාර ආයතනයකම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇත.

## *PRE BOOKED VISIT* ක්‍රමවේදය


මෙම ක්‍රමවේදය හරහා බන්ධනාගාරගතව සිටින තම ඥාතියා හමුවීම සඳහා දිනයක් හා වේලාවක් නිවසේ සිටම වෙන්කර ගැනීමේ පහසුකම ඥාතීන්ට ලබාදී ඇත. ඒ අනුව, තම ඥාතියා හමුවීමට යම් පුද්ගලයෙක් ඉල්ලීමක් සිදුකිරීමෙන් අනතුරුව අදාල බන්ධනාගාර ආයතනය විසින් ඒ සඳහා දිනයක් හා වේලාවක් සහිතව කෙටි දුරකථන පණිවිඩයක් ඉල්ලීම කරන පුද්ගලයාගේ ජංගම දුරකථනයට ලැබීමට සලස්වන අතර එම දිනයේ නියමිත වේලාවට බන්ධනාගාර ආයතනයට පැමිණි විට Pre Booked Visit ක්‍රමවේදය හරහා පෝලිම්වල රැදී නොසිට තම ඥතියා දැකබලා ගැනීමට අවස්ථාව ලැබේ.

බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් මේ සඳහා වෙබ් මුදුකාංගයක් නිර්මාණය කර ඇති අතර, ඒ හරහා දිනය හා වේලාව වෙන්කර ගැනීමට හැකියාව පවතී. මෙමගින් රැඳවියාගේ ඥාතීන්ට වේලාව නාස්තිවීමකින් තොරව ආරක්ෂිතව හා කඩිනමින් තම ඥාතියාව හමුවීමට අවස්ථාව ලැබෙන අතර අමුත්තන් පෙන්වීමේ කටයුත්ත විධිමත් පරිදි සිදුකිරීමට හා මනාව කළමනාකරණය කරගැනීමට බන්ධනාගාර පරිපාලනයට අවස්ථාව ලැබේ.

## *VIDEO VISITATION* ක්‍රමවේදය

රැඳවියන්ට හා ඔවුන්ගේ ඥාතීන්ට වීඩියෝ තාක්ෂණය හරහා තම ඥාතීන් දැකබලා ගැනීමටත්, ඔවුන් සමග කථා කිරීමටත්, අවස්ථාව ලැබෙන අතර, මෙම ක්‍රමවේදය තුළින් විශේෂයෙන්ම විදේශික සිර / සැකකරුවන්ට තම ඥාතීන් දැකබලා ගැනීමට අවස්ථාව සැලසේ. මෙම ක්‍රමවේදය තුලින්,

- ඥාතීන්ට කාලය හා මුදල් වැය කරමින් බන්ධනාගාර පරිශ්‍රයට පැමිණීමට අවශ්‍ය නොවන අතර තම නිවසේ සිටම බන්ධනාගාරයේ සිටින තම ඥාතියාව දැකබලා ගැනීම හා ඇමතීමට අවස්ථාව සැලසේ.
- බන්ධනාගාර ආයතන තුළ පවතින පෝලිම්වල රැදී සිටීමට අවශ්‍ය නොවීම.
- බන්ධනාගාර තුළට ඇතුල්වීමේදී සිදු කරන සෝදිසි කිරීම් ආදී අපහසුතාවන්ට ලක් නොවීම
- කොවිඩ් – 19 වැනි වසංගත තත්වයන්ට නිරාවරණය වීමට ඇති ඉඩකඩ වැලැක්වීම.
- විදේශික රැඳවියන්ට තම ඥාතීන් දැක බලා ගැනීමට අවස්ථාව සැලසීම.








# වීඩියෝ තාක්ෂණය ඔස්සේ අධිකරණ කටයුතු

රැඳවියන් අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත ක්‍රමවේදයක අවශ්‍යතාවය පහත කරුණු හේතුවෙන් පැණ නැගී ඇත.

- රටේ පවතින කොවිඩ් - 19 වසංගත තත්වය හේතුවෙන් රැඳවියන් අධිකරණ කටයුතු සඳහා ඉදිරිපත් කිරීමෙන් අධිකරණයට මෙන්ම අධිකරණ තුළින් බන්ධනාගාර තුළට ද කොවිඩ් - 19 වෛරසය ඇතුළු වීමේ අවධානම් තත්වය.
- අධිකරණ කාර්යමණ්ඩල වලට මෙන්ම බන්ධනාගාර කාර්ය මණ්ඩල වලට ද කොවිඩ් - 19 වැළඳීමේ අවධානමක් පැවතීම.
- අධිකරණ වලට රැඳවියන් ඉදිරිපත් නොකිරීමෙන් රැඳවියන්ගේ නඩු කටයුතු වල සිදුවන ප්‍රමාදයන්.
- විශේෂ ගණයේ රැඳවියන් බන්ධනාගාරයෙන් පිටත දී ප්‍රහාරයන්ට ලක්වීමේ ඇති ඉඩකඩ.

මෙම ක්‍රමවේදය තුළින් බන්ධනාගාර ආයතනවලට තම අධිකරණ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායිව සිදුකිරීමට අවස්ථාව සැලසෙනවා මෙන්ම දිනපතා රැඳවියන් ප්‍රවාහනය කිරීමට වැයකරන විශාල මුදලක් ඉතිරිවීමද සිදුවේ. තවද මේ හරහා බන්ධනාගාර ආයතන තුළට තහනම් ද්‍රව්‍ය ඇතුළුවීම අවම කරගැනීමටද හැකියාව ලැබේ. විශේෂයෙන් මෙම ක්‍රමවේදය අභියාචනාධිකරණයේ කටයුතු සඳහා භාවිතා කරන අතර, අවශ්‍යතාවය අනුව අනෙකුත් අධිකරණ සඳහා ද භාවිතා කරයි.

මෙම ක්‍රමවේදය තවදුරටත් විධිමත් කිරීමේ ව්‍යාපෘතියක් වශයෙන් **Court Automation** ව්‍යාපෘතිය ඉදිරියේ දී සිදුකිරීමට නියමිතව ඇති අතර එමගින් අධිකරණ කටයුතු පරිගණක මෘදුකාංගයක් හරහා අධිකරණ හා බන්ධනාගාර සම්බන්ධ කරමින් සිදුකිරීමට සැලසුම්කර ඇත. එම ව්‍යාපෘතිය ගරු අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතිඥ අලි සබ්රි අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි අධිකරණ අමාත්‍යංශ ලේකම් එම්.එම්.පී.කේ. මායාදුන්නේ මහතාගේ අධීක්ෂණය යටතේ සිදුවේ.

# දැඩුවම වෙනුවට පුනරුත්ථාපනය

බන්ධනාගාරගත වන රැඳවියන්ගෙන් 2/3 ක පමණ ප්‍රමාණයක් බන්ධනාගාර ගත වන්නේ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිවලට බව නිරීක්ෂණය වන තත්ත්වයක් වන අතර නැවත නැවත බන්ධනාගාර ගතවන පිරිසෙන් බහුතරය ද මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් බව නිරීක්ෂණය වේ.

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් නැවත නැවත බන්ධනාගාරගත වීම වැලැක්වීමට නම් ඔවුන් බන්ධනාගාරගත කිරීමට විකල්පයක් ලෙස විධිමත් පුනරුත්ථාපන ක්‍රමවේදයකට නතු කිරීම වඩාත් යෝග්‍ය වේ. එසේ නොමැතිව ඔවුන් නැවත බන්ධනාගාරගතවීම වැලැක්වීම පහසු කාර්යයක් නොවන බවත්, නැවත බන්ධනාගාරගත වීම තුළින් බන්ධනාගාරවලට පරිපාලනමය ගැටළු රාශියකටද මුහුණුදීමට සිදුවේ.

මෙම තත්ත්වයට ප්‍රායෝගික හා සඵලදායි විසඳුමක් වශයෙන් වීරවිල එළිමහන් සිරකඳවුර මත්ද්‍රව්‍යට ඇබ්බැහිවූවන් ප්‍රතිකාර හා පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනයට කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර, මේ වන විට නියමු ව්‍යාපෘතියක් ලෙස රැඳවියන් 500ක් රැඳවීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කර අවසන් කර ඇත.

මෙම මධ්‍යස්ථානය තුළ රැඳවියන් 2000ක් පුනරුත්ථාපනය කිරීමට පහසුකම් සංවර්ධනය කිරීමට ඉදිරියේ දී අපේක්ෂා කරන අතර, ඒ සඳහා ආරක්ෂක අමාත්‍යංශය මගින් ලබාදෙන පෙරසවි ගොඩනැගිලි භාවිතා කිරීමට සැලසුම් කර ඇත. එමෙන්ම, පුනරුත්ථාපන ක්‍රමවේදය සඳහා අන්තරාදායක ඖෂධ පාලක ජාතික මණ්ඩලය, වෘත්තීය පුහුණු අධිකාරිය වැනි අදාළ ආයතන හා අමාත්‍යංශ සම්බන්ධ කරගැනීමට සැලසුම් කර ඇති අතර, ඒ හරහා නූතන රැකියා වෙළඳපොලට ගැලපෙන පරිදි වෘත්තීය දැනුම හා පළපුරුද්දක් රැඳවියන්ට ලබා දීමට අපේක්ෂා කෙරේ.







# ධාරිතා සංවර්ධනය







වසර ගණනාවක් තිස්සේ පුරප්පාඩුව පැවති තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට නොහැකි වීම හේතුවෙන් දෙපාර්තමේන්තුව තුළ ගැටළු රාශියක් මතුව ඇත. සමස්ථයක් ලෙස සැලකූ විට දෙපාර්තමේන්තුව තුළ මේ වන විට නිලධාරීන් 2000 කට ආසන්න හිඟයක් පවතින අතර, එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට මේවන විට පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

- ජේලර්වරුන් 65 ක් කාන්තා ජේලර් 05 ක් හා පුනරුත්ථාපන නිලධාරීන් 12 ක් , නිලධාරිණියන් 02 බඳවාගෙන අඟුණකොලපැලැස්ස බන්ධනාගාර පුහුණු පාසැලේ මූලික පුහුණුව අවසන් කර බන්ධනාගාර ආයතන වෙත අනුයුක්ත කර ඇත.

- වසර 12 ක සේවා කාලයකින් පසුව නීත්‍යානුකූලව ත්‍රිවිධ හමුදාවෙන් ඉවත් වූ නිලධාරීන් 200 ක් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ **SPEAT FORCE** සඳහා බඳවා ගැනීම අවසන් කර බූස්ස යුධ හමුදා කඳවුරේ පුහුණුව ආරම්භ කර ඇත.

- බන්ධනාගාර නියාමක නිලධාරීන් 788 ක් බඳවා ගැනීම අවසන් කර ඇති අතර, තෝරාගත් නිලධාරීන් දිවයින පුරා තෝරාගත් බන්ධනාගාර ආයතන 26 කදී දින 14 ක ප්‍රායෝගික පුහුණුවට යොමු කර ඇත.



# 12 වන ආධුනික බන්ධනාගාර II පෙළ ජේලර් හා පුනරුත්ථාපන නිලධාරීන්ගේ විසිර යාම



බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පැවති පුරප්පාඩු සඳහා බඳවාගත් ආධුනික බන්ධනාගාර II පෙළ ජේලර් හා පුනරුත්ථාපන නිලධාරීන් සඳහා පවත්වන ලද අතර, විසිර යාමේ පෙළපාලිය 2021.11.26 වන දින ගරු අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතීඥ එම්.යූ.එම්. අලි සබ්රි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අඟුණකොළපැලැස්ස බන්ධනාගාර ක්‍රීඩාංගනයේ දී පවත්වන ලදී.



# නව තාක්ෂණයෙන් සන්නද්ධ වන බන්ධනාගාරය

බන්ධනාගාර ආයතන පරිශ්‍රයන් හා පුද්ගලයින් තුළ සඟවා තබා ගන්නා තහනම් ඉලෙක්ට්‍රොනික උපාංග අත්අඩංගුවට ගැනීම සඳහා සිදුකරන හදිසි  සෝදිසි මෙහෙයුම් නිවැරදිව වඩා කාර්යක්ෂමව තාක්ෂණය භාවිතයෙන් සිදු කිරීම සඳහා බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය වෙත ***Non- linear Junction Detector*** හා ***Hand held Non- linear Junction Detectors*** උපකරණ 2021 වර්ෂයේ දී හඳුන්වා දීමටත් ඒවා භාවිතය සඳහා නිලධාරීන් පුහුණු කිරීමටත් කටයුතු කරන ලදී.



එමෙන්ම, නගරාශ්‍රිත බන්ධනාගාර තුලට තහනම් ද්‍රව්‍ය විසිකරන පුද්ගලයින් හා එම තහනම් ද්‍රව්‍ය නිරීක්ෂණය කිරීමටත්, බන්ධනාගාර රැඳවියන් බන්ධනාගාර තුළ සිට සිදුකරන නීති විරෝධී කටයුතු හා හැසිරීම් දුරස්ථව සිට අධීක්ෂණය කිරීමටත් අවශ්‍ය ***Day & Night Camera*** සහිත ***Quadcopter ( Drone )*** යන්ත්‍රයක් ***SPEAT Force*** වෙත ලබා ලබාදීමත් එය භාවිතය සඳහා නිලධාරීන් පුහුණු කිරීම සිදු කරන ලදී.



# බන්ධනාගාරයට හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායක්





බන්ධනාගාර බුද්ධි හා ආරක්ෂක ඒකකය පසුගිය කාලවකවානුව තුළ මන්දගාමී තත්ත්වයකින් යුතුව ක්‍රියාත්මක විය. මෙම තත්වය සුරක්ෂිත රටක් විනයගරුක, ගුණගරුක හා නීති ගරුක සමාජයක් සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායේ හා ආරක්ෂක ලේකම් තුමාගේ අවධානයට ලක්වූ අතර, ඒ අනුව මෙම ඒකකයේ ප්‍රතිසංවිධාන කටයුතු ආරම්භ විය.

ඒ අනුව, බන්ධනාගාර බුද්ධි හා ආරක්ෂක ඒකකය යන නම **ශ්‍රී ලංකා බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය (SPEAT Force)** වශයෙන් සංශෝධනය කිරීමට කටයුතු කල අතර, බන්ධනාගාර බුද්ධි ඒකකය ද මෙම හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය යටතට ගැනීමට කටයුතු කරන ලදී. මෙම ඒකකය විසින් ආයතන තුල හදිසි සෝදිසි කිරීම් සිදු කිරීම, බන්ධනාගාර තුළට ඇතුළුවන පුද්ගලයින්, වාහන, භාණ්ඩ හා ද්‍රව්‍ය සෝදිසියට ලක්කිරීම, බන්ධනාගාර ආයතන වල හදිසි වැටලීම් සිදු කිරීම, බුද්ධි තොරතුරු රැස් කිරීම හා අදාළ විමර්ශණ කටයුතු සිදුකිරීම ආදිය සිදුකරයි. එමෙන්ම, අක්‍රමිකතා වල යෙදෙන නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ට විරුද්ධව විනයානුකූලව හා නීත්‍යානුකූලව කටයුතු කිරීමද මෙම ඒකකය විසින් සිදුකරයි.

මෙම ඒකකයේ නිලධාරීන්ට නව පුහුණු පාඨමාලාවන් ගණනාවක් ලබාදීමට කටයුතු කල අතර, ඔවුන්ට නව නිල ඇඳුම් හඳුන්වා දීමද සිදුකරන ලදී. තවද මෙම ඒකකය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ත්‍රිවිධ හමුදාවෙන් නීත්‍යානුකූලව ඉවත් වූ නිලධාරීන් 200 ක් බඳවාගැනීම සිදුකර බූස්ස යුධ හමුදා කඳවුරේ දී පුහුණු කටයුතු ආරම්භ කර ඇත.

# 102 වන ආධුනික බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ නිලධාරීන්ගේ විසිර යාම

බන්ධනාගාර දෙපාර්තමේන්තුවට ප්‍රථම වතාවට බඳවා ගන්නා ලද ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවේ වසර 12 ක සේවා කාලයක් නිම කර නීත්‍යානුකූලව සේවයෙන් ඉවත් වූ නිලධාරීන් 194 දෙනෙකු
බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් ලෙස විසිර යාම 2022.01.26 වන දින අඟුණකොළපැලැස්ස බන්ධනාගාර ක්‍රීඩාංගනයේ දී ආරක්ෂක ලේකම් ජෙනරල් පී.ඩී.එච්. කමල් ගුණරත්න (විශ්‍රාමික) මහතාගේ ප්‍රධානත්වයෙන් හා ජාතික බුද්ධි අංශ ප්‍රධානී මේජර් ජනරාල් පීවක රුවන් කුලතුංග මහතාගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදී.

බන්ධනාගාර දෙපාර්තමේන්තු පස් අවුරුදු සැලැස්මෙහි බන්ධනාගාර ආයතනයන්හි ආරක්ෂක විධිවිධාන ශක්තිමත් කිරීම යන අරමුණ යටතේ හඳුනාගෙන ඇති පරිදි හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායට බඳවා ගන්නා මෙම නිලධාරීන් විශේෂ ආරක්ෂණ, කැරලි මර්ධන යන විශේෂ කටයුතු සඳහා ද යොදා ගැනීමට නියමිත ය.











# බන්ධනාගාර බුද්ධි අංශය ප්‍රතිසංවිධානය කිරීම





ශ්‍රී ලංකා බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය යටතේ බන්ධනාගාර බුද්ධි ඒකකය ශක්තිමත් කිරීම හා එහි නිලධාරීන්ගේ ධාරිතාවය වැඩිදියුණු කිරීමට අවශ්‍ය කටයුතු පසුගිය මාස කිහිපය තුළ සිදුකළ සුවිශේෂී කටයුත්තකි. රාජ්‍ය බුද්ධි සේවාව හා ජාතික බුද්ධි ඒකකය සමග සම්බන්ධ වෙමින් බුද්ධි තොරතුරු එක්රැස් කරමින් බන්ධනාගාර ආයතන වල ආරක්ෂාව නගාසිටුවීම හා විමර්ශන සිදු කිරීමත්, බන්ධනාගාර බුද්ධි ඒකකය හා රජයේ අනෙකුත් බුද්ධි ඒකක හරහා දෙපාර්තමේන්තුවේ දූෂිත නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ට විරුද්ධව අවශ්‍ය නීතිමය හා විනය පියවර ගැනීමද මෙම ඒකකය විසින් සිදුකරයි.

මෙම ඒකකය ශක්තිමත් කිරීම සඳහා පොලිස් විශේෂ කාර්ය බලකාය හරහා මෙම ඒකකයේ නිලධාරීන්ට පුහුණු අවස්ථා ලබා දී දැනුම හා කුසලතා වර්ධනය කිරීමට කටයුතු කල අතර, රාජ්‍ය බුද්ධි සේවාව මගින් බන්ධනාගාර බුද්ධි ඒකකයේ නිලධාරීන් 90 කට පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු සිදුකරන ලදී.

එමෙන්ම, මෙම ඒකකය ශක්තිමත් කිරීමෙහිලා ආරක්ෂක ලේකම්තුමාගේ, ජාතික බුද්ධි ප්‍රධානි හා රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂක තුමාගේ මැදිහත්වීම හා දායකත්වය විශාල පිටුවහලක් විය.





# නව පුහුණු පාසලක්

ඉතිහාසය පුරාවටම බන්ධනාගාර පුහුණු පාසල ලෙස භාවිතා කරනු ලැබුවේ කොළඹ බන්ධනාගාර පරිශ්‍රය තුළ පවතින බන්ධනාගාර පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානයයි. නමුත්, පහත කරුණු හේතු කොටගෙන වෙනත් බන්ධනාගාර පුහුණු පාසලට අනුබද්ධ ආයතනයක් අඟුණකොළපැලැස්ස බන්ධනාගාර පරිශ්‍රය තුළ පිහිටුවීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

- කොළඹ බන්ධනාගාර පුහුණු පාසල තුළ එක්වර පුහුණු කිරීමේ පහසුකම් ඇත්තේ නිලධාරීන් 80 කට පමණක් වීම.
- ප්‍රමාණවත් දේශන ශාලා පහසුකම් හා නවාතැන් පහසුකම් නොමැතිවීම.
- පුහුණු පාසලේ නවාතැන් ස්ථාන මේවන විට පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන්ගේ නවාතැන් සඳහා වෙන්කර තිබීම.
- ඉදිරියේ දී නිලධාරීන් 1000 කට ආසන්න සංඛ්‍යාවක් බඳවා ගැනීමට නියමිත බැවින්, ඔවුන් පුහුණු කිරීමට ප්‍රමාණවත් පුහුණු පහසුකම් නොමැති වීම.

ඒ අනුව, අඟුණකොලපැලැස්ස බන්ධනාගාර පරිශ්‍රය තුළ ප්‍රමාණවත් පහසුකම් සහිත පුහුණු පාසලක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදි.

එමෙන්ම, කොළඹ බන්ධනාගාර පරිශ්‍රය හොරණ ප්‍රදේශයට විතැන් කිරීමෙන් අනතුරුව එහි අංග සම්පූර්ණ විශෝධන අධ්‍යන කේන්ද්‍රයක් ස්ථාපිත කිරීමට දැනටමත් සැලසුම්කර ඇත.




# නිදහස

" මා මාගේ සිර කුටියෙන් නික්මී සිර ගෙදර දොරටුව වෙත පියවර මනිමින් මාගේ නිදහස කරා ඇවිද යන ගමනේ දී, මා තේරුම්ගත් කරුණ වන්නේ, ගෙවූ ඒ කටුක නීරස අතීතය හා ඒ හා බැඳි වෛරය මා මේ දොරටුව අසල තබා නොයනතාක් කල් මා සිටිනුයේ සිරගතව බවයි "

**- නෙල්සන් මැන්ඩෙලා**

# රැඳවි ජීවිතයට දෙවන අවස්ථාවක්






රටේ අධිකරණ පද්ධතිය මගින් වරදකරුවන්ට මරණ දඬුවම ලබා දුන්න ද මරණ දඬුවම ක්‍රියාත්මක නොවීම හා දීර්ඝකාලීන සිරකරුවන්ට අදාළ බන්ධනාගාර ආඥා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව සිව්වස් සමාලෝචන ක්‍රමවේදය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් රැඳවියන් බන්ධනාගාර තුළ එක්රැස්වීම දිගින් දිගටම සිදුවන ක්‍රියාවලියකි. මෙහි ප්‍රතිඵල ලෙස එම රැඳවියන් අතර මානසික පීඩනය වර්ධනය වීම හා බන්ධනාගාර තුළ රැඳවි තදබදය වර්ධනය වීමක් දැකිය හැකිය.

ඒ අනුව, අතිගරු ජනාධිපති තුමා විසින් පත්කරන ලද සුරක්ෂිත රටක් විනයගරුක, ගුණගරුක හා නීති ගරුක සමාජයක් සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායේ සුවිශේෂී ප්‍රමුඛතා යටතේ සිරකරුවන්ගේ තදබදය අඩුකිරීම සඳහා පොදු සමාව දීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාවලියකට අමතරව සමාලෝචන ක්‍රමවේදයක් හරහා විශේෂ සමාව ප්‍රදානය කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම යන්නද ඇතුළත් කර ප්‍රමුඛතාවයක් ලබාදී ඇත.

සමාව ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය  අමාත්‍යංශය, අනෙකුත් අදාළ ආයතන හා දෙපාර්තමේන්තු නියෝජනය වන පරිදි කමිටුවක් පත් කරන ලද අතර, එම කමිටුවේ අවසන් වාර්තාව මේ වන විට ගරු අධිකරණ අමාත්‍යවරයාට භාර දීමට කටයුතු කර ඇත. මෙම කටයුත්ත සිදුකිරීමේ දි ගරු අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතිඥ අලි සබ්රි අමාත්‍යතුමා, බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු ගරු රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්තේ අමාත්‍යතුමා හා ගරු රාජ්‍ය අමාත්‍ය සුදර්ශනී ප්‍රනාන්දු පුල්ලේ මැතිණිය අවශ්‍ය උපදෙස් හා සුවිශේෂී දායකත්වයක් ලබාදෙන ලදී.

# බන්ධනාගාර ජාත්‍යන්තර ප්‍රමිතියට



කොළඹ බන්ධනාගාර සංකීර්ණය බන්ධනාගාර මූලස්ථානය, බන්ධනාගාර පුහුණු පාසල, වැලිකඩ බන්ධනාගාරය, කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය,නව මැගසින් බන්ධනාගාරය, බන්ධනාගාර රෝහල, කාන්තා අංශය හා බන්ධනාගාර නිල නිවාස ආදියෙන් සමන්විත වේ.

මෙම සංකීර්ණයේ වන ප්‍රධාන බන්ධනාගාර ආයතන තුන වන වැලිකඩ, මැගසින්, කොළඹ රිමාණ්ඩ් යන ආයතන තුළ අධික තදබදයක් මේවන විට නිර්මාණය වී ඇති අතර, ඒවායේ පවතින ගොඩනැගිලි ඉතා පැරණි ඒවාය. තවද, එම ආයතන තුළ රැඳවියන්ට සැපයිය හැක්කේ ඉතාම අවම පහසුකම් ප්‍රමාණයක් පමණක් බව නිරීක්ෂණය වේ. මෙම ආයතනවල පවතින සීමිත ඉඩකඩ නිසාත් බන්ධනාගාරය අවට ඉතා ජනාකීර්ණ තත්ත්වයක් නිර්මාණය වී ඇති නිසාත් එම ආයතන තුළ ප්‍රමාණවත් ඉඩකඩ නොතිබීම නිසාත් නව ගොඩනැගිලි ඉදිකිරීමට හෝ තවදුරටත් එම ආයතන පුළුල්කිරීමට නොහැකි මට්ටමකට පත්ව ඇත.

තවද, සිරකරුවන්ට සැලකීම සම්බන්ධයෙන් වන ප්‍රමිතීන් හා ජාත්‍යන්තර ප්‍රඥප්තීන්ට අනුකූල වීමේ දී එම අවශ්‍යතා කොළඹ බන්ධනාගාර ආයතන තුළ ප්‍රමාණවත් පරිදි සැපයීමට නොහැකි තත්ත්වයක් පවතින අතර ඊට විකල්පයක් ලෙස වඩා ඉඩකඩ හා පහසුකම් ඇති බන්ධනාගාර ආයතන ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය මතුව තිබේ. තවද කොළඹ බන්ධනාගාර පරිශ්‍රය තුළ රාජකාරි සිදුකරන නිලධාරීන්ටද රාජකාරි කිරීමට සිදුව ඇත්තේ ඉතා අවම පහසුකම් ප්‍රමාණයක් සමග නිසා ඔවුන්ද පීඩාවට පත්වීම  දීර්ඝ කාලයක් තිස්සේ සිදුවන්නකි. එමෙන්ම කොළඹ බන්ධනාගාර සංකීර්ණය පිහිටා ඇති භූමියේ වාණිජමය වටිනාකම හේතුවෙන් රටේ ආර්ථිකමය වටිනාකමකින් යුක්ත ව්‍යාපෘති සඳහා මෙම භූමිය භාවිතා කිරීමේ හැකියාවක් ද පවති.

ඒ අනුව, කොළඹ බන්ධනාගාර පරිශ්‍රය හොරණ, මිල්ලෑව ප්‍රදේශයට පුනස්ථාපනය කිරීමට අවශ්‍ය මූලික කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය සමග මේවන විට සිදුකරමින් පවතින අතර, මැගසින් බන්ධනාගාරය පුනස්ථාපනය සඳහා වන මූලික සැලසුම් හා නිර්මාණ කටයුතු සිදු කර අවසන්කර ඇත.


ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රීය සමාජවාදී ජනරජයේ
අතිගරු ජනාධිපති
ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින්
වැලිකඩ බන්ධනාගාර පරිශ්‍රය
පුනස්ථාපනය කිරීමට නියමිත
හොරණ, මිල්ලෑව ප්‍රදේශයේ
සිදුකළ

# ක්ෂේත්‍ර චාරිකාව









# පුහුණු අවස්ථා



බන්ධනාගාර ආයතන වල රාජකාරි සිදුකිරීමේ දී
නිලධාරීන්ට නිතිපතා රටේ නීතිපද්ධතිය සමග කටයුතු කිරීමට සිදුවනවා සේම
අධිකරණ පද්ධතිය මගින් වරදකරුවන් හෝ
වරදකට සැකකරුවන් කළ පුද්ගලයින් සමග සිය රාජකාරි කිරීමට සිදුවේ.
තවද, ඔවුන්ට රාජකාරි කිරීමට සිදුවන්නේ
මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම් පිළිබඳ ගැටළු නිරන්තරයෙන්
මතුවිය හැකි ඉතා අවධානම් හා පීඩාකාරී රැකියා පරිසරයක් තුළ වීම නිසා එම
විෂයයන් පිළිබඳව මෙන්ම බන්ධනාගාර පරිපාලනය පිළිබඳව යාවත්කාලීන වන
ජාත්‍යන්තර නීති රෙගුලාසි පිළිබඳව ද මනා අවබෝධයක් තිබිය යුතු වේ.

එබැවින්, බන්ධනාගාර නිලධාරීන්ට නිරන්තරයෙන් පුහුණු අවස්ථා සහ
අධ්‍යයන අවස්ථා ලබාදීම ඉතාමත් අත්‍යවශ්‍ය තත්ත්වයකි.
ඒ අනුව,
පසුගිය කාලය තුළදී කොවිඩ් වසංගත තත්ත්වය තුළ වුවද
නිලධාරීන්ට පුහුණු අවස්ථා රැසක්
ලබාදීමට කටයුතු කරන ලදි.

# නිලධාරීන්ගේ පුහුණු වැඩමුළු වල ප්‍රගතිය

**01** ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය සිරකරුවන්ට සැලකීමේ අවම ප්‍රමිතීන් සම්බන්ධයෙන් පුහුණු වැඩමුළු දෙකක් පැවැත්වීම.

**02** UNODC ආයතනය විසින් බන්ධනාගාර කළමනාකරණය, ගතික ආරක්ෂාව සම්බන්ධයෙන් සියළුම බන්ධනාගාර කොමසාරිස්වරුන්, බන්ධනාගාර අධිකාරිවරුන්, සියළුම ප්‍රධාන ජේලර්වරුන් සඳහා පුහුණු වැඩමුළු 05 ක් පැවැත්වීම

**03** ගාල්ල, බූස්ස, මාතර, අඟුණකොළපැලැස්ස බන්ධනාගාර වල රාජකාරි සිදුකරන නිලධාරීන්ගෙන් තෝරාගනු ලැබූ නියාමක නිලධාරීන් හා සැරයන් නිලධාරීන්ට UNODC ආයතනය මගින් ගතික ආරක්ෂාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

**04** කරන්දෙණිය සන්නද්ධ බුද්ධි පුහුණු පාසල මගින් බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ නිලධාරීන් හට පුහුණු වැඩමුළු පැවැත්වීම.

**05** පොලිස් විශේෂ කාර්ය බලකාය මගින් ජ්‍යෙෂ්ඨ බන්ධනාගාර නිලධාරීන්ට හා හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ නිලධාරීන්ට පුහුණු වැඩමුළු පැවැත්වීම.

**06** යුද්ධ හමුදාව මගින් ජ්‍යෙෂ්ඨ බන්ධනාගාර නිලධාරීන්ට පුහුණු වැඩමුළුවක් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇත.

**07** UNODC/ICRC යන ආයතනය හරහා බන්ධනාගාර කළමනාකරණය, මැන්ඩෙලා රීති, ගතික ආරක්ෂාව, සිද්ධි කළමනාකරණය, සෝදිසි කිරීම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් රාශියක් ඉදිරියේ දී සිදු කිරීමට සැලසුම් කර ඇත.







"මෙම වසංගත තත්ත්වය බාහිර සමාජයට මෙන්ම බන්ධනාගාර ආයතනවලට ද දැඩි අභියෝගයක් වී ඇති අතර, මේ වන විට බන්ධනාගාර ආයතන ගණනාවකින්ම රෝගීන් හඳුනාගෙන ඇත. විශේෂයෙන්ම බන්ධනාගාර ආයතන තුළ පවතින තදබදය හේතුවෙන් මෙම වසංගතය ව්‍යාප්තවීම පාලනය කිරීමට දැඩි වෙහෙසක් දැරිය යුතුව පවතී. එමෙන්ම, බන්ධනාගාර ආයතන තුළ සිටින රැඳවියන් බොහෝ දෙනෙකු සෞඛ්‍ය පුරුදු භාවිතා කිරීම සම්බන්ධයෙන් ද මැලි බවක් දක්වන කොටසක් බැවින් නිර්දේශිත සෞඛ්‍ය උපදෙස් අනුගමනය කිරීමට ඔවුන් මෙහෙයවීම ද අසීරු කාර්යයක් බවට පත්ව තිබේ.

කෙසේ වුවද, බන්ධනාගාර ආයතන තුළ කොවිඩ්-19 වසංගත තත්ත්වය ව්‍යාප්තවීම වැලැක්වීමටත් රෝගීන් හඳුනාගතහොත් ඔවුන්ට ප්‍රතිකාර කිරීමටත් විශේෂ පියවර ගණනාවක් මේවන විට ක්‍රියාත්මක කොට ඇත. මෙම ක්‍රියාවලියේ දී සෞඛ්‍ය අමාත්‍යංශය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු කාර්ය මණ්ඩලය හා කොවිඩ් වැලැක්වීමේ ජනාධිපති කාර්යසාධක බලකාය විශේෂ දායකත්වයක් ලබාදෙන අතර, මේවන තෙක් ගන්නා ලද පියවර මෙහි දැක්වේ."




- බන්ධනාගාර තුළ රැඳවි ජනගහනය අඩුකිරීමට නීතිපති දෙපාර්තමේන්තුව, අධිකරණ අමාත්‍යංශය, බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු අමාත්‍යංශය, පොලිස් දෙපාර්තමේන්තුව යන ආයතන සමග සම්බන්ධ වී අවශ්‍ය නීතිමය පියවර ගැනීම.

- අධිකරණවලින් බන්ධනාගාරගත කරන රැඳවියන් නිරෝධායනය සඳහා පල්ලන්සේන, බූස්ස හා පැරණි බෝගම්බර යන බන්ධනාගාර ආයතන මධ්‍යස්ථාන ලෙස භාවිතා කිරීම.

- කොවිඩ් - 19 ආසාධිතයින් ලෙස හඳුනාගන්නා රැඳවියන්ට ප්‍රතිකාර කිරීමේ මධ්‍යස්ථාන ලෙස අයියකච්චි යුද්ධ හමුදා කඳවුර, පල්ලෙකැලේ එළිමහන් සිරකඳවුර, තල්දෙන තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල බන්ධනාගාර ආයතනය, වටරැක බන්ධනාගාර වැඩ කඳවුර, අගුණුකොලපැලැස්ස බන්ධනාගාර කාන්තා අංශය, වැලිකඩ බන්ධනාගාර රෝහල, අඹේපුස්ස පබෝධා මෙත් සෙවන බන්ධනාගාර ආයතනය යන ස්ථාන සෞඛ්‍ය කාර්යමණ්ඩල වල අධීක්ෂණය යටතේ පවත්වාගෙන යාම.

- කොවිඩ් - 19 වසංගත තත්ත්වය සම්බන්ධයෙන් නේවාසිකයින්ගේ තොරතුරු ඥාතීන්ට ලබාදීම සඳහා තොරතුරු කේන්ද්‍රයක් ස්ථාපිත කිරීම.

- බන්ධනාගාර නිලධාරීන් එන්නත්කරණය යටතේ එන්නත් මාත්‍රා දෙකම මේවන විට නිලධාරීන්ට ලබාදීමට කටයුතු කර තිබීම.

- බන්ධනාගාර රැඳවියන්ට එන්නත්කරණය ආරම්භ කිරීම

# පැරණි බෝගම්බරට බන්ධනාගාර කෞතුකාගාරයක්





බන්ධනාගාර දෙපාර්තමේන්තු ඉතිහාසය තුළ බෝගම්බර බන්ධනාගාරයට සුවිශේෂී වැදගත්කමක් හිමිවන අතර, මෙම බන්ධනාගාර පරිශ්‍රය පල්ලෙකැලේ ස්ථාපිත කිරීමත් සමග පැරණි බෝගම්බර බන්ධනාගාරය පිහිටි භූමිය නාගරික සංවර්ධන අධිකාරියට පවරන ලදී. නමුත්, එහි ඉදිරි සංවර්ධන කටයුතු සිදුකිරීමේ දී ලංකාවේ පළමුවරට බන්ධනාගාර කෞතුකාගාරයක් එම ගොඩනැගිල්ලේ කොටසක ඉදිකිරීමට යෝජනා කිරීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

ඒ අනුව, මෙම ස්ථානයේ ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ක්‍රමයේ විකාශනය ලංකාවේ රජ සමයේ සිට දඬුවම් ක්‍රමවල විකාශනය, ලංකාවේ අපරාධ යුක්ති ක්‍රමය, ලංකාවේ බන්ධනාගාරවල ඇති පෞරාණික භාණ්ඩ, බන්ධනාගාරගත වී සිටි විශේෂිත රැඳවියන් පිළිබඳ ඓතිහාසික තොරතුරු, බන්ධනාගාර නිලධාරියා විසින් භාවිතා කරන ලද නිල ඇඳුම් හා අනෙකුත් උපාංගවල විකාශනය ඇතුළු ඓතිහාසිකව වැදගත් වන තොරතුරු මහජනතාවට දැකබලා ගැනීමටත් මේ පිළිබඳව අධ්‍යයනය කිරීමට අපේක්ෂා කරන පාර්ශවයන්ට අවබෝධයක් ලබාදීමත් මෙහි අරමුණ වේ.

මෙම ස්ථානයේ කෞතුකාගාරයට අමතරව බන්ධනාගාර නිෂ්පාදන අලෙවිසැලක් හා බන්ධනාගාර ජීවිතය හා බැඳුණු වටපිටාවක් සහිත අවන්හලක් ස්ථාපිත කිරීමටත්, එම ආපනශාලාවේ ව්‍යුහය සිරමැදිරි වල ස්වභාවයෙන් සකස් කිරීමටත් අපේක්ෂා කෙරේ. තවද මෙම ස්ථානය විදේශීය සංචාරකයින් ආකර්ෂණය වන අයුරින් නිර්මාණය කිරීමට නියමිත ය.

මෙම ව්‍යාපෘතිය බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමාගේ හා එම අමාත්‍යංශයේ ලේකම් විශ්‍රාමික මේජර් ජනරාල් වී.ආර්. සිල්වා මහතාගේ ද උපදෙස් අනුව ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරමින් පවතී.

# බන්ධනාගාර සේවාව විශෝධන සේවාවක් බවට පත් කිරීම



**"LEADERS OF CORRECTIONS"**

සිරකරුවන්ට සැලකීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ අවම ප්‍රමිතීන්ට අනුකූලව කලාපයේ අනෙකුත් රටවල් බොහෝමයක් බන්ධනාගාර සේවය විශෝධන සේවයක් ලෙස ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර, විධිමත් ක්‍රමවේදයන්ට අනුකූලව නිලධාරීන් බඳවාගැනීම, පුහුණුකිරීම හා උසස්කිරීම් ආදිය ද සිදුකරයි.

එසේ වුවද, ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතුව විධිමත්ව අනුමත වු සේවා ව්‍යවස්ථාවක් නොමැතිවීම හේතුවෙන් බඳවාගැනීම්, පුහුණු කිරීම්, උසස්කිරීම් ආදියේ දි විවිධ ගැටලු වලට මුහුණදීමට සිදුවන අවස්ථා පවතී. ඇතැම් අවස්ථාවලදී එකම තනතුර සඳහා විවිධ අවස්ථාවලදී වෙනස් වු බඳවාගැනීම් ක්‍රමවේදයන් අනුගමනය කිරීමට සිදුවන අවස්ථා පවතී. තවද, බොහෝ කලාපීය රටවල් බන්ධනාගාර සංකල්පය විශෝධන සංකල්පයක් බවට පරිවර්තනය කිරීම සිදුකර ඇති අතර, ශ්‍රී ලංකා බන්ධනාගාර සේවය ද විශෝධන සේවයක් බවට පත්කර වෘත්තීමය සේවයක් ලෙස ස්ථාපිත කිරීම කාලීන අවශ්‍යතාවයක් බවට පත්ව ඇත.

ඒ අනුව, බන්ධනාගාර සේවය විශෝධන සේවයක් බවට පත් කිරීමට අවශ්‍ය සේවා සේවා ව්‍යවස්ථාවක් සකස්කොට අවශ්‍ය අනුමැතීන් ලබාගැනීමට යොමුකර ඇත.

# රැඳවියන්ට නවාතැන් සංවර්ධනය



බන්ධනාගාර ආයතන තුළ දැඩි තදබදයක් පවතින බැවින්, තවදුරටත් ගොඩනැගිලි ඉදිකිරීමට ඉඩකඩ සහිත බන්ධනාගාර ආයතන තුළ ස්ථිර සහ පෙරසවි ගොඩනැගිලි ඉදිකිරීම හරහා තදබදය අවම කර ගැනීමට අපේක්ෂා කෙරේ. මෙම ඉදිකිරීම් කටයුතු යුද්ධ හමුදාව, නාවික හමුදාව හා සිවිල් ආරක්ෂක බලකායේ පූර්ණ සහයෝගය හා අධීක්ෂණය යටතේ සිදුවන ව්‍යාපෘතීන්ය.

## ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීම් වල ප්‍රගතිය

ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීම මේ වන විට පල්ලන්සේන බන්ධනාගාරය තුළ සිදුවන අතර, එහි ඉදිකරන ගොඩනැගිලි හතරෙහි කටයුතු අවසන් අදියරේ පවතී.

## පෙරසවි ගොඩනැගිලි ඉදිකිරීම් වල ප්‍රගතිය

පෙරසවි ගොඩනැගිලි ඉදිකිරීමට සැලසුම්කර ඇත්තේ වාරියපොල, මැගසින්, දුම්බර, කළුතර හා මහර යනබන්ධනාගාර ආයතන තුළයි. ඒ අනුව, දුම්බර බන්ධනාගාරය හැර අනෙකුත් බන්ධනාගාර වල මෙම ඉදිකිරීම් ආරම්භ කර ඇති අතර, වාරියපොල බන්ධනාගාරයේ එක් ගොඩනැගිල්ලක ඉදිකිරීම් අවසන් අදියරේ පවතී.

# රැඳවි ශ්‍රමයෙන් කාබනික පොහොර








අතිගරු ජනාධිපතිතුමන්ගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව වසවිසෙන් තොර ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ අරමුණ සාක්ෂාත් කිරීම වෙනුවෙන් බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමාගේ සංකල්පයකට අනුව බන්ධනාගාර ගත රැඳවියන්ගේ ශ්‍රම දායකත්වයෙන් කාබනික පොහොර නිෂ්පාදනය සහ වසවිසෙන් තොර එළවළු සහ පළතුරු බන්ධනාගාර ආශ්‍රිතව නිෂ්පාදනය කිරීමේ වැඩසටහනක් මඩකලපුව එළිමහන් බන්ධනාගාර පරිශ්‍රයේ දී ආරම්භ කෙරිණ.

"සරුසාර" සිපිරි ගෙයින් ගොවි බිමට යන තේමාව පෙරටුකොට ගෙන මෙම වැඩපිළිවෙල ඉදිරියේ දී වීරවිල, කඳුරුගස්ආර, තල්දෙන, හංගිලිපොල හා අනුරාධපුර යන එළිමහන් බන්ධනාගාර ආයතන තුළ ආරම්භ කිරීමට නියමිත ය. රැඳවියන්ගේ පුනරුත්ථාපන ක්‍රියාවලියට අනුව, ඔවුන්ගේ මානසික සෞඛ්‍ය ඉහළ නැංවීමත්, ඔවුන් හට ස්වයං රැකියාවක් සඳහා අවශ්‍ය වෘත්තීය පුහුණුවක් ලබාදීමත් මෙමගින් සිදුවේ.

සරුසාර
සිපිරිගෙයින් ගොවිබිමට

## කොවිඩ් ජය ගැනීමට හදිසි සැලැස්මක්



ඉතා සීග්‍රයෙන් ලොව පුරා ව්‍යාප්තව ගිය කොවිඩ් වසංගතය බන්ධනාගාර වලට එල්ල කලේ විශාල අභියෝගයකි. එයට ප්‍රධානතම හේතුව වූයේ කොවිඩ් වසංගතය ව්‍යාප්තවීම වැලැක්වීම සඳහා නිර්දේශිත ප්‍රතිකර්ම වූ සමාජ දුරස්ථභාවය බන්ධනාගාර තුල සිදු කිරීමට අපහසුම කාර්යය වීමයි. ඒ අනුව, අධික බන්ධනාගාර තදබදය තුළ හා සමාජ දුරස්ථභාවය පැවැත්වීමට අපහසුම තත්වයක් තුළ රැඳවියන් හා නිලධාරීන් මෙම වසංගතයෙන් ගලවා ගැනීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුවට විශාල ප්‍රයත්නයක් දැරීමට සිදුවිය.



ඒ අනුව,

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ කාර්යාලයේ අනුග්‍රහය සහිතව බන්ධනාගාර තුළ කොවිඩ් මැඩලීම සඳහා හදිසි සැලැස්මත් සකස් කිරීමට කටයුතු කළ අතර, බන්ධනාගාරයක් තුළ එදිනෙදා සිදුවන ක්‍රියාවලියේ දී කොවිඩ් වසංගතයෙන් ආරක්ෂා වී එම කටයුතු සිදුකළ යුතු ආකාරයය මෙන්ම යම් හෙයකින් නිලධාරියෙකු හෝ රැඳවියෙකු ආසාධිත වුවහොත් ගතයුතු ක්‍රියාමාර්ගයෙන් පිළිබඳ මගපෙන්වීමක් මේ මගින් සිදුකර ඇත.



## සිද්ධි කළමනාකරණයට හදිසි සැලැස්මක්



බන්ධනාගාරය තුළ කැරලි තත්වයන්, ආහාර වර්ජන, වහල මත නැගී උද්ඝෝෂණය කිරීම් රැඳවියන් හෝ නිලධාරීන් ප්‍රාණ ඇපයට ගැනීම් සිදුවන අවස්ථා බන්ධනාගාර වලින් වාර්තා වේ. එවැනි ඇතැම් සිදුවීම් ඇතැම් අවස්ථාවලදී අවසන් වන්නේ ජීවිත මෙන්ම දේපළ හානීන් ද සිදුකරමිනි. එබැවින්, එවැනි සිදුවීම් ඇතිවීම වැලැක්වීමටත්, සිද්ධියක් ඇති වුවහොත් එය ජීවිත හා දේපළ හානි නොමැතිව කළමනාකරණය කරගැනීමත් අත්‍යවශ්‍ය තත්වයකි.



ඒ අනුව, උක්ත සිදුවීම් බන්ධනාගාරය තුළ ඇති වුවහොත් ජීවිත හා දේපල හානි සිදු නොවන අයුරින් ඒවා වෘත්තීයමය ප්‍රවේශයකින් යුතුව කළමනාකරණය කිරීමට අවශ්‍ය මග පෙන්වීම සඳහා බන්ධනාගාර මූලස්ථානයේ හා බන්ධනාගාර ආයතන වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සම්බන්ධ කරගනිමින් එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලයේ ද සහයෝගය ඇතිව හදිසි සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරන ලදී.

# අධිකරණාභිමානයක උතුරු පළාත්, ජන අභිමුව යුක්තියේ ප්‍රවේශය

අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය යථාර්ථයක් බවට පත් කිරීම අරමුණු කරගෙන අධිකරණ අමාත්‍යංශය හා ඒ යටතේ පවතින ආයතන ගමින් ගමට දොරින් දොරට අධිකරණාභිමානයක උතුරු පළාත්, ජන අභිමුව යුක්තියේ ප්‍රවේශය ජංගම සේවයේ සමාරම්භක උත්සවය 2022.01.27 වන දින කිළිනොච්චිය මධ්‍ය මහා විද්‍යාලයෙන් අති උත්කර්ෂවත් අන්දමින් ආරම්භ කරන ලදී. එම වැඩසටහන 2022.01.28 වන දින දක්වා පැවති අතර, 29,30 යන දිනවල යාපනය මධ්‍ය මහා විද්‍යාලයේ දී පවත්වන ලදී.

ඒ අනුව, අධිකරණ අමාත්‍යංශය යටතේ පවතින සියළුම ආයතන වලින් සිදුවන කාර්යභාරය පිළිබඳව උතුරු පළාතේ කිලිනොච්චිය, යාපනය, මුලතිව්, මන්නාරම, වව්නියා යන දිස්ත්‍රික්ක වල ජනතාව දැනුවත් කිරීමත් සාමය, සංහිඳියාව පිළිබඳ උතුරු පළාතේ ජනතාවට මනා අවබෝධයක් ලබා දීමත් මෙහි මූලික අරමුණ විය. මෙම ජංගම සේවයට බන්ධනාගාර දෙපාර්තමේන්තුව ද සක්‍රියව දායක වූ අතර, එහිදී පහත සඳහන් පහසුකම් ජනතාවට ලබා දීමට කටයුතු සිදු කරන ලදී.

- බන්ධනාගාර ගත සිර/සැකකරුවන්ගේ ඥාතීන්ට පැනනගින ගැටළු වලට විසඳුම් ලබා දීම
- පවතින කොවිඩ් - 19 තත්වය හමුවේ රැඳවියන් බැලීමට නොහැකි වූ උතුරු පළාතේ සිර/සැකකරුවන්ගේ ඥාතීන් හට බන්ධනාගාර දෙපාර්තමේන්තුව හඳුන්වා දුන් e-visit තාක්ෂණය ඔස්සේ ඕනෑම බන්ධනාගාරයක රඳවා සිටින රැඳවියෙකුට අමුත්තන් බැලීමේ පහසුකම එම අවස්ථාවේදීම සලසා දීම
- බන්ධනාගාර නිලධාරීන් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම
- උතුරු පළාතේ සිර/සැකකරුවන්ගේ නීති ගැටළු සඳහා නීති ආධාර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දීම හා නීති උපදෙස් ලබා දීම
- බන්ධනාගාර නිලධාරීන්ගේ හා නිලධාරිණියන්ගේ ගැටළු සඳහා අවශ්‍ය විසඳුම් ලබා දීම
- උතුරු පළාතේ කිලිනොච්චිය, වව්නියාව, මන්නාරම, යාපනය, මුලතිව් යන දිස්ත්‍රික්ක වල පාසැල් දරුවන් මත්ද්‍රව්‍ය වලට හා විවිධ අපරාධ වලට යොමු වීම වැලැක්වීමට පාසල් දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

මීට සමගාමීව ගරු අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතිඥ අලි සබ්රි මැතිතුමා යාපනය බන්ධනාගාරයේ නිරීක්ෂණ සංචාරයක යෙදුනි. එම අවස්ථාව සඳහා අධිකරණ අමාත්‍යංශ ලේකම් එම්.එම්.පී.කේ. මායාදුන්න මැතිතුමා, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහතා ප්‍රමුඛ ජ්‍යෙෂ්ඨ බන්ධනාගාර නිලධාරීන් සහභාගී විය.


ACCESS TO JUSTICE
நீதிக்கான அணுகல்















# පුනරුත්ථාපන වැඩසටහන්

# " අමදිවි රිද්ම - එක්ව බැඳී මතින් මිදෙමු "









- මෙය මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ බන්ධනාගාර ගත රැඳවියන් පුනරුත්ථාපනය කිරීම, බන්ධනාගාර ගත වූවන් මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවීම වළක්වා ගැනීම අරමුණු කරගෙන ' අමදිවි රිද්ම – එක්ව බැඳී මතින් මිදෙමු ' තේමාව යටතේ බන්ධනාගාර තුළ මත්ද්‍රව්‍ය නිවාරණය කිරීමේ විශේෂ ව්‍යාපෘතියක් ලෙස ආරම්භ විය.

- මෙය නියමු ව්‍යාපෘතියක් ලෙස කොළඹ බන්ධනාගාර ත්‍රිත්වය කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක වේ.

- බන්ධනාගාර රැඳවියන් අතුරින් මත්ද්‍රව්‍ය විරෝධී ආකල්ප ඇති රැඳවි කණ්ඩායම් සහචර නායකයන් ලෙස පුහුණු කර ඔවුන් හරහා මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූවන් මුදා ගැනීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය නිර්මාණය කරන ලදී.

- මෙහි දෙවන අදියර ක්‍රියාත්මක කිරීමට වන පුනරුත්ථාපන මධ්‍යස්ථාන ලෙස නම් කර ඇති පල්ලෙකැලේ, වටරැක, තල්දෙන, වීරවිල, අනුරාධපුර, පල්ලන්සේන, කන්දෙවත්ත, මීතිරිගල, කළුතර, අඹේපුස්ස යන මධ්‍යස්ථාන හඳුනාගෙන ඇති අතර, එහි ඉදිරි කටයුතු සිදුකිරීමට සැලසුම් කර ඇත.

# රැඳවි පුනරුත්ථාපනය කියවීම තුලින්



අධිකරණ මගින් විවිධ චෝදනාවන්ට ලක්ව බන්ධනාගාරගත කරන රැඳවියන්ගේ මානසික සංවර්ධනය ඇති කරලීමටත්, ඔවුන්ගේ දැනුම වර්ධනය කරලීමටත්, ඒ තුළින් යහපත් ආකල්ප ගොඩනැගීමත් මූලික අරමුණ කරගනිමින් පුස්තකාල සේවා මණ්ඩලය හා එක්ව සියලුම බන්ධනාගාර ආයතනයන් තුළ නේවාසික පුස්තකාල විධිමත් කිරීමට කටයුතු කර ඇත. මේ යටතේ පුස්තකාල ක්‍රමවේදයන් පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීමට පියවර ගැනීමට නියමිත ය. මේ වන විට බන්ධනාගාර රැඳවියන් විසින් නිර්මාණය කරන ලද "අනුවසව ආසව" නම් නවකතාවත් "සිපිරිගේ පාමුල" නම් රැඳවි කාව්‍ය නිර්මාණ සංග්‍රහයත් එළිදැක්වීමට අප දෙපාර්තමේන්තුව සමත්ව ඇත. තවද "සිපිරිගේ පාමුල 2 කාව්‍ය සංග්‍රහය" ද ඉතා කඩිනමින් එළි දැක්වීමට මේවන විටත් කටයුතු සැලසුම් කරමින් සිටී. මේ තුළින් නේවාසිකයින්ගේ කුසලතා වර්ධනයක් මෙන්ම ආකල්පමය වෙනසක් ඇති කිරීමටත් සමත්ව ඇති හෙයින් නේවාසික පුස්තකාල කටයුතු විධිමත් ක්‍රමවේදයක් යටතේ සකස් කර, එහි පවතින යටිතල පහසුකම් තවදුරටත් වර්ධනය කර ඒ තුළින් නේවාසික රැඳවියන් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම අපේක්ෂා කෙරේ. මෙම කාර්යය සාර්ථක සිදුකරගැනිමට රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සහය ලබාදෙයි.

මෙහි ආරම්භක පියවරක් ලෙස කොළඹ වෙස්ලි විද්‍යාලයේ බාලදක්ෂ සමාජයේ අනුග්‍රහයෙන් වටරැක තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයේ පුස්තකාලය නවීකරණය කරන ලදී.

# අර්ධ බන්ධනාගාර සංකල්පය ක්‍රියාත්මක කිරීම



අර්ධ බන්ධනාගාර සංකල්පයේ දී සිදු වන්නේ තෝරාගත් රැඳවියන්
උදෑසන බන්ධනාගාරයෙන් පිටත්ව
බාහිර ආයතන වලට තම ශ්‍රමය ලබා දී දිනය අවසානයේ
නැවත බන්ධනාගාරයට පැමිණීමේ ක්‍රමවේදයකි.
මෙමගින් රැඳවියන්ගේ ශ්‍රමය ඵලදායී ලෙස භාවිතා වීමක් සිදු වන අතර,
එම රැඳවියන්ට අදාළ වෘත්තියේ නිපුණතාවක් ලැබේ.
එහිදී රැඳවියාට තම ශ්‍රමය වෙනුවෙන් වැටුපක් ද හිමිවන අතර පුනරුත්ථාපන
ක්‍රියාවලියට ද මනා පිටුවහලක් සපයයි.

මෙම සංකල්පය දැනට වටරැක එළිමහන් වැඩ කඳවුර තුළ
ක්‍රියාත්මක වන අතර,
එම රැඳවියන් දැනට ඇවන්ට් ග්‍රේඩ් ආයතනයේ
ව්‍යාපෘති වලට සම්බන්ධ කොට ඇත.
ඔවුන් දිනපතා උදෑසන ගොස් නැවත බන්ධනාගාරයට පැමිණෙන අතර
එහිදී ඔවුන්ගේ ශ්‍රමයට සරිලන වැටුපක් හිමිවනවා සේම තමන් යෙදෙන වෘත්තිය
සම්බන්ධයෙන් වන නිපුණත්වයක් ද ලබයි.









# " සති පාසල "

විවිධ වැරදි සම්බන්ධයෙන් අධිකරණය මගින් දඬුවම් නියමව බන්ධනාගාර ගත වන රැඳවියන් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමේ පුනරුත්ථාපන ක්‍රියාවලියේ ඉතා සුවිශේෂී වැඩසටහනක් ලෙස පූජ්‍ය උඩර්රියගම ධම්මජීව ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වයෙන් පූජ්‍ය අතුරුගිරියේ ධම්මවිහාරී ස්වාමීන්වහන්ගේ විසින් මෙහෙයවන "සාර්ථක ජීවිතයකට සතිමත් බව" වැඩසටහන සියළුම බන්ධනාගාර වල රැඳවියන් වෙනුවෙන් සාර්ථකව පවත්වාගෙන යනු ලබයි. පවතින කොවිඩ් වසංගත තත්වය නිසා මාර්ගගතව මෙම වැඩසටහන පසුගිය කාලය පුරාද පවත්වන ලදී.

දැනට මෙම වැඩසටහන දිවයිනේ සියළුම බන්ධනාගාර ආයතන වල රාජකාරි සිදු කරන පුනරුත්ථාපන නිලධාරීන් වෙනුවෙන් ද පවත්වා ඇති අතර, ඉදිරියේ දී කණ්ඩායම් ලෙස සෙසු නිලධාරීන් සඳහා ද මෙම වැඩසටහන පැවැත්වීමට නියමිත ය.

නැවත නැවත බන්ධනාගාරගතවීමේ ප්‍රධාන හේතුවක් වන්නේ රැඳවියන් නිදහස්වීමෙන් පසුව ඔවුන්ව විධිමත් පරිදි අධීක්ෂණයකට ලක්නොවීම හා ඔවුන් නැවත වාරයක් එම පරිසරයටම හා තමා බන්ධනාගාරගත වීමට පෙර ඇසුරුකල පිරිස් වෙතම සම්බන්ධ වීමයි. එමෙන්ම, ඔවුන්ට ජීවත්වීමට ප්‍රමාණවත් හා සරිලන ජීවනෝපායක් නොමැතිවීමත් නැවත බන්ධනාගාරගත වීමේ එක් හේතුවකි.

ඒ අනුව, බන්ධනාගාර ආයතනවලින් නිදහස්වන රැඳවියන් විධිමත් පරිදි සමාජගත කිරීම හා නැවත බන්ධනාගාර ගතවීම අවම කිරීම සඳහා පවුල් සුභසාධනය සහිතව පසුහාර වැඩසටහනක් දිප ව්‍යාප්තව සංවිධානය කිරීමට කටයුතු සැලසුම්කර ඇත. ඒ අනුව, නැවත බන්ධනාගාර ගතවීම වැලැක්වීමේ අරමුණ පෙරදැරිව නිදහස් රැඳවියන්ට ක්‍රමවත් ජීවනෝපායක් සකස්කර ගැනීමට මග පෙන්වීම හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා රාජ්‍ය නිලධාරි යාන්ත්‍රණය මගින් ඔවුන් සුරක්ෂිත ලෙස සමාජ පිළිගැනීමක් සහිතව සමාජගත කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහනේදී ප්‍රාදේශීය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් හා අදාළ රාජ්‍ය නිලධාරීන්ගේ හා බන්ධනාගාර පුනරුත්ථාපන නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පසුහාර කමිටු පිහිටුවා එම කමිටු මාසිකව රැස්වී ප්‍රගතිය සමාලෝචනය කිරීම සිදුකරයි.

සුරක්ෂිත රටක් විනය ගරුක, ගුණ ගරුක හා නීතිගරුක සමාජයක් සඳහා වන ජනාධිපති කාර්යසාධක බලකාය විසින් අවධානය යොමුකල යුතු කාර්යභාරයක් ලෙස නැවත නැවත බන්ධනාගාරගතවීම වැලැක්වීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කිරීම යන්න අවධාරණය කර ඇත. එම අරමුණ මුදුන්පත් කරගැනීම සඳහා මෙම වැඩසටහන විධිමත්ව ක්‍රියාත්මක වීම ඉතා ප්‍රයෝජනවත් වනු ඇත. ඒ අනුව, 2021 පෙබරවාරි මස 18 වන දින කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ආරක්ෂක ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් සම්බන්ධ කරගනිමින් පැවැත්වූ සමුළුවේ දී උක්ත වැඩසටහන විධිමත් පරිදි සිදුකිරීමට උපදෙස් ලබාදෙන ලදී.

| සංස්කරණය | | නිර්මාණ සංකල්පය |
|---|---|---|
|  |  |  |
| අජිත් බස්නායක | කාංචනමාලා මහන්තිල | කැලුම් හෙට්ටිගොඩ |
| බන්ධනාගාර අධිකාරී | නියෝජ්‍ය අධ්‍යක්ෂ ( ක්‍රමසම්පාදන ) | බන්ධනාගාර නියාමක |



බන්ධනාගාර මූලස්ථානය, කොළඹ - 09.